---

**දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව දොඩන්ගොඩ ප්‍රදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර තිබූ රු.3,075,000 ක් වූ ව්‍යාපෘති 4 ක් 2012 වර්ෂයේ වියදමට හර කර ණයහිමි ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත වැය හා ණයහිමි ශේෂය රු.3,075,000 කින් වැඩියෙන් දැක්විණ.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ශේෂය වූ රු.1,556,501 ක් ප්‍රා.ස. 19 හි වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම සඳහා ගලපා නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 100,080,640 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,626,457 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,930,415 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) වරිපනම් හා බදු | 3,571 | 2,010 | 6,793 |
| (ii.) බදු කුලී | 157 | 113 | 170 |
| (iii.) බලපත්‍ර ගාස්තු | 113 | 112 | 116 |

2:2:2 වරිපනම් බදු

(අ) වාර්ෂික වරිපනම් ඇස්තමේන්තුව රු.2,492,691 ක් වී තිබූ අතර 2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.4,924,718 ක් විය. මෙම ශේෂය තුළ සමාලෝචිත වර්ෂයට අදාල රු.1,432,126 ක්ද, ඉකුත් වර්ෂවලට අදාලව රු.3,492,592 ක හිඟයක් ද විය.

(ආ) සභාව අවසන් වරට 2008 වර්ෂයේ දී වරිපනම් බදු තක්සේරුව කර තිබූ අතර 2009 වර්ෂයේ සිට 2012 අවසානය දක්වා අනුමත කර තිබූ ගොඩනැගිලි අයදුම්පත් සංඛ්‍යාව 392 ක් විය. 2013 ජනවාරි 24 වන විට ඉන් අනුකූලතා සහතික ලබා ගෙන තිබුණේ සැළසුම් 39 කට පමණි. අනුකූලතා සහතික ලබා ගෙන නොතිබූ අනුමත සැළසුම් 353 ක් සම්බන්ධයෙන් අදාල ගොඩනැගිලි සාදා නිම කර තිබේදැයි සොයා බලා තාවකාලික තක්සේරුවක් කර වරිපනම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.3 අක්කර බදු

---------------

(අ) 2012 වර්ෂයේ අක්කර බදු බිල් කළ ආදායම රු.96,924 ක් වුවද 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.1,292,745 ක් විය.

(ආ) අක්කර බදු අයකිරීම් සිදු කරනු ලබන කලාප 4 හි දේපල 126 ක් ඉඩම් වෙන්දේසි කිරීම, දරුවන් අතරේ ඉඩම් බෙදීම, විකිණීම ආදී හේතු නිසා අක්කර බදු ලේඛනයෙන් ඉවත් කළ යුතු බවට ආදායම් පරිපාලක විසින් සමීක්ෂණයක් මගින් 2012 අගෝස්තු, සැප්තැම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී සභාවට දන්වා තිබුණද අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

2:2:4 බදු කුලී

--------

(අ) නැබඩ පොදු වෙළඳ පළෙහි කඩ කාමර අංක 129, 1999 වර්ෂයේ සිට බදු දී තිබූ අතර 1999 අප්‍රේල් 30 දිනෙන් පසුව බදු කරු විසින් බදු ගිවිසුම අත්සන් කිරීම හා කුලී ගෙවීම පැහැර හැර තිබීම නිසා 2012 දෙසැම්බර් 31 දිනට රු.21,000 ක් හිඟව පැවතියද, කඩය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දොඩන්ගොඩ පොදු වෙළඳපළෙහි කඩ කාමර අංක 20 බදු ගෙනතබූ බදු කරුගෙන් 2003 සිට 2011 පෙබරවාරි දක්වා අයවීමට තිබූ රු.24,456 ක් වූ හිඟ කුලිය විගණිත දිනය වූ 2013 ජනවාරි 23 වන විටත් අය වී නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයට පෙර සිට පැවත එන රු.38,319 ක් වූ මස්කඩ කුලී ශේෂය අයකරගැනීමට විගණිත දිනය වූ 2013 ජනවාරි 23 වන විටත් කටයුතු කර නොතිබුණි.

2.2.5 තාවකාලික කඩ හා බිම් කොටස් බදු

තාවකාලික කඩ හා බිම් කොටස් ටෙන්ඩර් කිරීමේදී විධිමත් ප්‍රචාරන දැන්වීම් ක්‍රමයක් අනුගමනය කර නොතිබීම හේතුවෙන් ටෙන්ඩර් කරන ලද දේපල 23 න් 16 කට පමණක් එක් අයදුම්පත බැගින් මිල ගණන් ඉදිරිපත් වී තිබූ අතර ඒවාට ටෙන්ඩර් පිරිනමා තිබුණි. ඉතිරි දේපල 7 සඳහා නැවත ටෙන්ඩර් කැඳවා තිබුණි.

2:2:6 වෙනත් ආදායම්

(අ) වැලි තොටුපල බදුදීම

තෙබුවන ගඟ පැත්තේ වැලි තොටුපළ 2012 වර්ෂය සඳහා බදු ගෙන තිබූ බදුකරු 2011 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවිය යුතු බදු මුදල් රු.34,000, 2012 ඔක්තෝබර් 23 දින ආදායම් පරිපාලක විසින් ලබාගෙන තිබුණද එම මුදල් කාර්යාලයට ගෙවා නොතිබූ බව අනාවරණය විය.

(ආ) විනෝද බදු ආදායම

ගංඉම තරුණ සංවිධානය විසින් 2012 සැප්තැම්බර් 28 දිනට රෙජිතවත්ත ක්‍රීඩාංගණයේදී සංවිධානය කර තිබූ 'සුපර් ගෝල්ඩ් කලර් නයිට් 2012' ප්‍රසංගය වෙනුවෙන් අයවිය යුතුව තිබූ විනෝද බදු මුදල් 2013 ජනවාරි 24 දින වන විටත් අය නොවී පැවතුණි.

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 7,767,897 |
| (ii) | මුද්දර ගාස්තු | 11,706,724 |

---

2.3 කොන්ත්‍රාත් පරිපාලනය

---

2.3.1 ඇටෝරාවිල පාරට කුට්ටි ගල් ඇතිරීම

---

මග නැඟුම ව්‍යාපෘතිය යටතේ ඉහත මාර්ගයේ මීටර් 174.05 ක් දිගට මීටර් 2.7 ක් පළලට කුට්ටිගල් ඇතිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.873,674 ක් වැය කර තිබුණි.

මාර්ගයේ හරහට ගලා යන දිය පාරක් වූ අතර එම දිය පාර වෙනුවෙන් මීටර් 8.3 ක පමාණයක් අත හැර දමා නැවතත් කුට්ටි ගල් අතුරා තිබූ නමුත් මාර්ගයේ ගමන් ගන්නා මගීන්ට දිය පාරෙන් එගොඩ වීම සඳහා අවශ්‍ය පහසුකම් සළසා නොතිබූ අතර දිය පාර ආසන්නයේ වර්ග මීටර් 0.9 ක ප්‍රමාණයක ගල් ගැලවී තිබෙනු 2013 ජනවාරි 23 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

2.3.2 වටුලගොඩ දොඩන්ගොඩ 01 සැතපුම් කණුව අසළ දයා ගුණවර්ධන මයාගේ නිවස දක්වා මාර්ගය

---

මගනැඟුම ව්‍යාපෘතිය යටතේ ඉහත මාර්ගය දිග මීටර් 114.5 ක් හා පළල මීටර් 2.5 ක් සඳහා කුට්ටි ගල් ඇතිරීමට රු.611,243 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

2013 ජනවාරි 23 දින වැඩ අධිකාර සමඟ සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(අ) ඉහත මාර්ගයේ දිග මීටර් 210 ක් හා පළල මීටර් 2.7 ක් සඳහා කුට්ටි ගල් ඇතිරීමට රු.1,140,000 කට ඇස්තමේන්තු සකස් කර තිබුණද මැණුම් අනුව මාර්ගයේ සම්පූර්ණ දිග මීටර් 97.5 ක් වීමෙන් මීටර් 112.5 ක් වැඩියෙන් ඇස්තමේන්තු කර තිබුණි.

(ආ) එකී මාර්ගයේ ආරම්භයේ සිට අවසානය තෙක් දිග මීටර් 97.5 ක් හා පළල මීටර් 2.7 ක් (වර්ග මීටර් 263.25) සඳහා දළ වශයෙන් වර්ග මීටරයට කුට්ටි ගල් 38 ක් වශයෙන් අතුරා තිබුණි. ඒ අනුව නිම කර තිබූ වර්ග මීටර් 263.25 ක් සඳහා දළ වශයෙන් අතුරා තිබූ කුට්ටි ගල් ප්‍රමාණය 10000 ක් විය. නමුත් අවසන් ගෙවීම් වාර්තාව අනුව කුට්ටි ගල් 12000 ක් සඳහා රු.393,960 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබීමෙන් කුට්ටි ගල් 2000 ක් සඳහා රු.65,660 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(ඇ) ඉහත මාර්ගය සහාවට අයත් පාරක් නොවූ බව මාර්ග ලේඛනය අනුව නිරීක්ෂණය වූ අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 6 ක් පමණක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

---

2.3.3 ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති

මහනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන-2012 යටතේ වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවට ප්‍රතිපාදන අනුමත කර තිබූ එකතුව රු.33,301,000 ක් වූ ව්‍යාපෘති 41 ක් විගණිත දිනය වූ 2013 ජනවාරි 24 වන විටත් ආරම්භ කර නොතිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2.4.1 අත්තිකාරම් ගෙවීම

(අ) 2009 සිට ලබා දී තිබූ එකතුව රු.241,277 ක් වූ අත්තිකාරම් ශේෂ 6 ක් විගණිත දිනය වූ 2013 ජනවාරි 23 වන විටත් පියවා නොතිබුණි. තවද, 1991 සිට 2006 දක්වා ලබා දී තිබූ එකතුව රු.173,523 ක් වූ අත්තිකාරම් ශේෂ 25 ක් ද විය.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව එක් වරකට දිය හැකි අත්තිකාරම් මුදල රු.20,000 කට නොවැඩි විය යුතු වුවද අවස්ථා 2 කදී එකතුව රු.223,825 ක් අත්තිකාරම් ලබා දී තිබුණි.

2.4.2 වත්කම් සමීක්ෂණය

සභාව විසින් සෑම වර්ෂයකම සමීක්ෂණ මණ්ඩල පත් කර තිබුණද 2007 වර්ෂයේ සිට සමීක්ෂණ කටයුතු සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි.

2.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.5 මිරිස්පැලවත්ත පාර කැපීම සම්බන්ධයෙන් වන්දි මුදල් ගෙවීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) බෝම්බුවල මිරිස්පැලවත්තේ සුදුවාදේවගේ විල්බට් යන අයගේ ඉඩමේ බටහිර මායිමේ තිබූ තාප්පය එම අයට දැනුම් දීමකින් තොරව සභාව විසින් 1999 නොවැම්බර් 27 දින කඩා දමා ඉඩමෙන් තවත් අඩි 3 ක් ලබා ගෙන නැබඩ ප්‍රධාන පාරේ සිට මිරිස්පැලවත්ත සම්බන්ධ කරන අඩි 4 ½ ක් පමණ වූ අඩි පාර අඩි 7 ¼ ක් වන සේ පළල් කිරීම නිසා සිදු ව තිබූ අලාභහානිය

වෙනුවෙන් සභාපතිට එදිරිව අංක MR 4373 දරන නඩුව කළුතර දිසා අධිකරණයේ 2000 ජනවාරි 24 දින පවරා තිබුණි.

(ආ) 2003 පෙබරවාරි 20 දින ලබා දී තිබූ නඩු තීන්දුවට අනුව රු.237,000 ක මුදලක්ද මුද්දර ගාස්තු, පෙනී සිටීම් හා ආනුශංගික ලේඛන සඳහා වියදම් ලෙස රු.31,975 ක වන්දියක් ගෙවීමට තීරණය වී තිබුණි.

(ඇ) ඉහත නඩු තීන්දුව වෙනස් කර ගැනීම සඳහා කළුතර සිවිල් අභියාචනාධිකරණයේ අංක 56/2004/F යටතේ සභාව විසින් අභියාචනයක් කර තිබූ නමුත් තීන්දුවේ වෙනසක් නොවී 2011 මැයි 19 දින ඉහත තීන්දුවම ප්‍රකාශයට පත් කර තිබුණි. මේ වෙනුවෙන්ද සභාව රු.56,000 ක වියදමක් දරා තිබුණි.

(ඈ) ඉහත නඩුව නිසා සභාවට රු.324,975 ක පාඩුවක් සිදු වී තිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 128, 132, 134 සහ පළාත් පාලන කොමසාරිස්ගේ 2008 අගෝස්තු 19 දිනැති අංක WP/LGD/10/2008 දරන චක්‍රලේඛයෙහි උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය